CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

## 2022 අංක 1 දරණ අධි ආරක්ෂක කලාප නියෝගය සම්බන්ධයෙන් වන ප්‍රශ්න සහ පිළිතුරු

**රාජ්‍ය රහස් පනත යනු කුමක්ද?**

වර්ෂ 1955 අංක 32 දරණ රාජ්‍ය රහස් පනත අපගේ නීති පොත්වල ඇති ආදි කාලීන නීතියක් වන අතර එය සැකසීම සඳහා පදනම් ලේඛනය වූ බවට සැලකෙන වර්ෂ 1911 එක්සත් රාජධානියේ රාජ්‍ය රහස් පනත බොහෝ විවේචනයට ලක්ව වර්තමානයේ අහෝසි කර ඇත. මෙම පනතේ අරමුණ වන්නේ *'රාජ්‍ය රහස් සහ රහස් ලේඛන වෙත ප්‍රවේශය සීමා කිරීම සහ ඒවා අනවසරයෙන් හෙළිදරව් කිරීම වැළැක්වීමයි'*. මෙම පනතේ විධිවිධාන යල් පැන ගිය සහ කුරිරු ප්‍රතිවිපාක උද්ගත කරනු ලබන අන්දමේ ඒවා වන අතර බලය අනිසි ලෙස භාවිතා කිරීම, විසම්මුතිය මර්දනය කිරීම සහ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සඳහා එමගින් ඉඩ ප්‍රස්ථාවක් නිර්මාණය කරනු ලබයි.

තොරතුරු යටපත් කිරීමට සහ මාධ්‍යවේදීන් බිය ගැන්වීම උදෙසා මෙම පනත භාවිතා කරනු ලබන බවට පසුගිය රජයන් විසින් තර්ජනය කළ අවස්ථා තිබේ. මහජන ආරක්ෂක ආඥාපනත සහ ත්‍රස්තවාදය වැළක්වීමේ පනත යටතේ අධි ආරක්ෂක කලාප (High Security Zones - HSZs) මීට පෙර ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇති අතර, අධි ආරක්ෂක කලාප පිහිටුවීම සඳහා රාජ්‍ය රහස් පනත භාවිතා කිරීම කනස්සල්ලට තුඩු දෙන පූර්වාදර්ශයක් වන අතර එය පනතේ විෂය පථයට පරිබාහිර ක්‍රියාවක් ද වේ.

**රාජ්‍ය රහස් පනත යටතේ කළ හැක්කේ කුමක්ද?**

රාජ්‍ය රහස් පනත යටතේ, *අනෙකුත් කරුණු අතර*, පහත සඳහන් දෑ සිදුකිරීමට ආරක්ෂක අමාත්‍යවරයාට ඉඩ ප්‍රස්ථාව ලබා දෙනු ලැබේ;

- 'තහනම් ස්ථානයක්' ප්‍රකාශයට පත් කිරීමට,
- රාජ්‍ය රහසක් භාර දී ඇති පුද්ගලයෙකුට එය හෙළි කිරීම තහනම් කරනු ලැබීමට, සහ
- මෙම ප්‍රධාන කාර්යයන් සම්බන්ධ ඇතැම් අමතර සීමා කිරීම්, වැරදි සහ ක්‍රියා පටිපාටිමය බලතල නිර්මාණය කිරීමට.

'තහනම් ස්ථානයක්' යනු 'ශ්‍රී ලංකාවේ ආරක්ෂාවට අදාළ තොරතුරු වඩා හොඳින් ආරක්ෂා කිරීම සහ ආරක්ෂක අරමුණු සඳහා භාවිතා කිරීමට අදහස් කරන උපකරණ, ආයතන, සංවිධාන හෝ ආයතන' සඳහා ප්‍රකාශයට පත් කරන ලද ස්ථානයකි. ආරක්ෂක අමාත්‍යවරයාගේ නියෝගයකට අනුව මේ සඳහා තහනම් යැයි ප්‍රකාශ කළ හැකි ස්ථාන වන්නේ 'ඕනෑම ඉඩමක්, ගොඩනැගිල්ලක්, නැවක් හෝ ගුවන් යානයක්' ය.

යම් ස්ථානයක් 'තහනම්' ලෙස ප්‍රකාශ කළ පසු, පනතේ අන්තර්ගත සීමාවන් කිහිපයක් ඊට අදාළව ක්‍රියාත්මක වේ. මෙකී සීමාවන් වලට ඇතුළත් වන්නේ;

- නිල රාජකාරියක් ඉටු කිරීමේදී හෝ බලපත්‍රයක් නොමැතිව එවැනි ස්ථානයකට ඇතුළුවීම තහනම් කිරීම (3 වන වගන්තිය);
- එවැනි ස්ථානයක ආරක්ෂක කටයුතු කරනු ලබන නිලධාරීන්ට 'අවහිර කිරීම හෝ දැනුවත්ව නොමග යැවීම හෝ වෙනත් ආකාරයකින් මැදිහත් වීම හෝ බාධා කිරීම' වරදකි (4 වන වගන්තිය);

- රාජකාරියක් ඉටු කිරීමේදී හෝ එම ස්ථානයේ ස්ථානගතව සිටින නිලධාරියෙකු විසින් හෝ බලපත්‍රයක් සහිතව මිස කැමරාවක් හෝ කටු සටහන් වලට ද්‍රව්‍ය එවැනි ස්ථානයකට ගෙන යාම වරදක් බවට පත් කරයි (5 වන වගන්තිය); හා

- රාජ්‍යයට අගතියක් වන අරමුණක් සඳහා එම ස්ථානයට ළඟාවීම හෝ පරීක්ෂා කිරීම හෝ ඡායාරූපයක් ගැනීම ඇතුළු 'ඔත්තු බැලීම' වරදක් බවට පත් කරයි (6 වන වගන්තිය).

පනත යටතේ වරදකට වසර 14ක් දක්වා බරපතල සිරදඬුවම් ලැබේ.

**රාජ්‍ය රහස් පනත යටතේ අධි ආරක්ෂක කලාප ඇති කිරීමට ජනාධිපතිවරයාට / ආරක්ෂක අමාත්‍යවරයාට හැකිද?**

රාජ්‍ය රහස් පනත මඟින් යම් යම් ස්ථාන තහනම් ස්ථාන ලෙස නියෝග කිරීමේ හැකියාව ආරක්ෂක අමාත්‍යවරයාට පමණක් ලබා දී ඇත. මෙම පනත මගින් අමාත්‍යවරයාට අධි ආරක්ෂක කලාප ප්‍රකාශයට පත් කිරීමට හෝ ඒවා කළමනාකරණය කිරීම සඳහා වන රෙගුලාසි සැපයීමට හෝ ඒ සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමේ බලය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට පැවරීමේ බලය ආරක්ෂක අමාත්‍යවරයාට ලබා නොදේ. ඒ අනුව ගත් කල, ජනාධිපතිට/ආරක්ෂක අමාත්‍යවරයාට මෙවන් වූ රෙගුලාසි සැකසීමට බලයක් නැති අතර ඒවා පැහැදිලි වශයෙන්ම රාජ්‍ය රහස් පනතට පටහැනි ක්‍රියාවන් වේ. මහජන ආරක්ෂක ආඥාපනත යටතේ හදිසි අවස්ථා රෙගුලාසි මගින් මීට පෙර අධි ආරක්ෂක කලාප ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති අතර, අධි ආරක්ෂක කලාප සම්බන්ධයෙන් බරපතල ගැටළු කිහිපයක් පවතින නමුදු, ඒ යටතේ ඇති කරන ලද රෙගුලාසි සති 2 ක් ඇතුළත පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතු බව මතක තබා ගත යුතුය අතර එසේ අනුමත නොවුවහොත් ඒවායෙහි වලංගු භාවයක් නොපවතී. කෙසේ වෙතත්, රාජ්‍ය රහස් පනත ප්‍රකාරව නිකුත් කර ඇති මෙම රෙගුලාසි සම්බන්ධයෙන් එවැනි අධීක්ෂණයක් නොමැත.

**ගැසට් පත්‍රය මගින් (2022 අධි ආරක්ෂක කලාප නියෝගය 1) සිදු වන්නේ කුමක්ද?**

මෙම ගැසට් පත්‍රය මගින් මහ කොළඹ ප්‍රදේශයේ ප්‍රදේශ කිහිපයක 'අධි ආරක්ෂක කලාප' ස්ථාපිත කරනු ලබන අතර එමගින් අවසානයේ නගරයේ විශාල කොටසක් ආවරණය කරනු ලබයි. එකී කලාපයන්ට අදාළ අවට ප්‍රදේශ හය පහතින් දැක්වේ;

අ. පාර්ලිමේන්තු සංකීර්ණය,

ආ. අලුත්කඩේ අධිකරණ සහ නීතිපති දෙපාර්තමේන්තුව,

ඇ. ජනාධිපති ලේකම් කාර්යාලය, ජනාධිපති මන්දිරය, ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය සහ පොලිස් මූලස්ථානය,

ඈ ආරක්ෂක අමාත්‍යාංශය සහ අකුරේගොඩ පිහිටි ශ්‍රී ලංකා යුද හමුදා මූලස්ථානය,

ඉ. කොම්පඤ්ඤ වීදියේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය,

ඊ. මල් පාරේ පිහිටි අගමැති කාර්යාලය,

උ. කොල්ලුපිටියේ අරලියගහ මන්දිරය

ඌ. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ ත්‍රිවිධ හමුදාපතිවරුන්ගේ නිල නිවාස.

**ගැසට් පත්‍රය මගින් (2022 අධි ආරක්ෂක කලාප නියෝගය 1) 'තහනම් ස්ථාන' නිර්මාණය කරනු ලබන්නේ ද?**

ආරක්ෂක අමාත්‍යවරයාට පනත යටතේ ප්‍රකාශ කිරීමට අවසර ඇති පරිදි ගැසට් මගින් නිර්මාණය කර ඇති කලාප 'තහනම් ස්ථාන' නොවන බව සඳහන් කළ යුතුය. ඒ වෙනුවට එකී ස්ථානයන් ''අධි ආරක්ෂක කලාප'' ලෙස

හැඩගස්වා/නම් කර ඇත. සම්පූර්ණ කලාපයක් එසේ ස්ථාපිත කිරීමට ඉඩ දෙන බවට පනතේ කිසිදු විධිවිධානයක් මගින් යෝජනා නොකරයි.

**2022 අධි ආරක්ෂක කලාප නියෝගය 1 මගින් මෙම අලුතින් ස්ථාපිත කරන ලද අධි ආරක්ෂක කලාප නියාමනය කරනු ලබන්නේ කෙසේද?**

මෙම ගැසට් පත්‍රය රාජ්‍ය රහස් පනත යටතේ සිදු කිරීමට නියමිත බව කියන අතරම, පනත යටතේ දැනටමත් ලබා දී ඇති පුළුල් බලතල ඉක්මවා යන ක්‍රියාවන් කිහිපයක් මෙම ගැසට් පත්‍රය මගින් සිදු කරනු ලබයි. ඒවාට ඇතුළත් වන්නේ;

- පනත මගින්, ආරක්ෂාව සම්බන්ධ තොරතුරු ආරක්ෂා කිරීමේ අරමුණින් පමණක්, යම් යම් ස්ථාන තහනම් ස්ථාන ලෙස ප්‍රකාශයට පත් කිරීමට පමණක් ඉඩ ලබා දී ඇති අතර, මෙම ගැසට් පත්‍රය මගින් ''අධි ආරක්ෂක කලාප'' නිර්මාණය කරනු ලබයි.

- අදාළ කලාපය තුළ ක්‍රියාකාරකම් පාලනය කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා විධාන නිකුත් කිරීම සඳහා ප්‍රතිපාදන සැකසීමට මෙම රෙගුලාසි යටතේ 'නිසි බලධාරියා' ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට ඉඩ දීම (4 වන නියෝගය).

- අධි ආරක්ෂක කලාපය තුළ කිසියම් ඉදිකිරීමක් හෝ කැණීමක් තහනම් කිරීම හෝ බලපත්‍රයක් සහිතව මිස ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් වෙන් කර ඇති අධි ආරක්ෂක කලාපය තුළ වාහන නැවැත්වීම තහනම් කිරීම (6 වන නියෝගය).

- ''මෙම නියෝගවල විධිවිධාන පොලිස්පතිවරයා විසින් ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල වන අතර, අවශ්‍ය අවස්ථාවලද එම කාර්යය සඳහා අධි ආරක්ෂක කලාපයන් තුළ යාන්ත්‍රිකව හෝ අන්‍යාකාරයකින් යම් කාර්යයක් කිරීම හෝ වාහන හෝ වෙනත් මාධ්‍යයක් භාවිත කිරීම නීත්‍යානුකූල වන්නේය'' යනුවෙන් (8 වන නියෝගය ප්‍රකාරව) සඳහන් වේ. මෙය අපැහැදිලි වන අතරම පොලිස්පතිවරයාට නව සහ පුළුල් බලතල ලබා දෙන තත්ත්වයක් ද බව පෙනේ.

- නිශ්චිතව දක්වා ඇති බලතල සම්බන්ධයෙන් කිසිදු සීමාවක් නොමැතිව මෙම රෙගුලාසි යටතේ පරීක්ෂා කිරීමට සහ ප්‍රශ්න කිරීමට අවශ්‍ය බලතල පොලිසියට ලබා දී ඇත.

- අදාළ කලාපය තුළ ඇති ගොඩනැගිලිවල ප්‍රධාන පදිංචිකරුට හෝ සේවා යෝජකයන්ට (රජයේ හෝ පෞද්ගලික) සියලුම ස්ථිර හෝ තාවකාලික පදිංචිකරුවන්/සේවකයන්ගේ ලැයිස්තුවක් පොලිසියට ලබා දීමට අවශ්‍ය කරවන කටයුතු සැලැස්විය හැකිය (10 සහ 11 වන නියෝග);

- පරීක්ෂණ සඳහා අධි ආරක්ෂක කලාපය තුළ පරිශ්‍රයයන්ට ඇතුළු වීමට පොලිසියට බලතල ලබා දීම (12 වන නියෝගය)

- අධි ආරක්ෂක කලාපය තුළ ගිනිකෙළි දැල්වීම වැළැක්වීම.

**2022 අධි ආරක්ෂක කලාප 1 වන නියෝගය හරහා නව වැරදි නිර්මාණය කරනු ලබන්නේ ද?**

ඔව්, මෙම රෙගුලාසි මගින් පනතෙන් ආවරණය නොවන සහ ශ්‍රී ලංකාවේ ආරක්ෂාවට අදාළ තොරතුරු ආරක්ෂා කිරීමට අදාළව කිසිදු සම්බන්ධයක් නැති නව වැරදි නිර්මාණය කරනු ලබයි. 2022 අධි ආරක්ෂක කලාප 1 වන නියෝගයේ අඩංගු ඕනෑම නියෝගයක් උල්ලංඝනය කිරීම වරදක් වේ.

2022 අධි ආරක්ෂිත කලාප 1 නියෝගය හා බැඳි විධිවිධාන යටතේ අත්අඩංගුවට ගන්නා ඕනෑම අයෙකුට ඇප ලබා ගැනීම දුෂ්කර වේ.

වරෙන්තුවක් නොමැතිව පුද්ගලයෙකු අත්අඩංගුවට ගත හැකි අතර එසේ අත්අඩංගුවට ගත් විට ඇප ලබා දිය හැක්කේ මහාධිකරණයට පමණි (9 වන නියෝගය).

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් මේ ආකාරයෙන් සීමා කරනු ලැබිය හැකිද?**

ශ්‍රී ලංකාව තුළ යාම ඊමේ  නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ සමාගමයේ යෙදීමේ නිදහස ඇතුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් සීමා කළ හැක්කේ සීමිත අවස්ථාවන්හිදී පමණක් වන අතර පාර්ලිමේන්තුව විසින් පනවනු ලබන නීතියෙන් එසේ සිදු කළ යුතුය. රෙගුලාසි මගින් මෙම අයිතිවාසිකම් සීමා කළ හැකි එකම අවස්ථාව වන්නේ හදිසි අවස්ථා රෙගුලාසි මගින් එසේ සිදු කරනු ලබන්නේ නම් පමණක් වන අතර, එසේ කළ හැක්කේ '*රාජ්‍ය ආරක්ෂාව ද රටේ යථා පැවැත්ම ද තහවුරු කිරීම පිණිසත්, මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිසත්, අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නන්වැදෑරුම් නිදහස නිසි පරිදි පිළිගන්නා බවට සහ ඊට නිසි පරිදි ගරු කරන බවට වග බලා ගැනීම පිණිසත්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුභ සාධනය සඳහා යුක්තිසහගතව අවශ්‍ය දෑ සපුරාලීම පිණිසත් ය* (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(7) ව්‍යවස්ථාව)'. මේ අනුව, වෙනත් කිසිදු නීතියක් යටතේ සාදන ලද නියෝග මගින් මූලික අයිතිවාසිකම් සීමා කිරීමට අවසර නැත.